# ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රවේශයක් (යෝජනා මාලාව) 3

## ජනතා සභා

□ මෙය රට පුරාම පිහිටුවන ව්‍යූහයක් නොව සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශ, වෙනත් සංස්කෘතික අනන්‍යතාවන් සහිත ජන කණ්ඩායම් ජීවත් වන ප්‍රදේශ, ජාතිකත්ව පීඩනයන්ට ලක්වීම නිසා විශේෂ මැදිහත්වීමක් අවශ්‍ය ප්‍රදේශ ආදී ලෙස අවශ්‍යතාවයට අනුව ඒ ඒ ප්‍රදේශ සඳහා පිහිටුවිය යුතුය.

□ ජනතා සභා පිහිටුවන ප්‍රදේශ තීරණය කිරීම සඳහා විද්වතුන්ගෙන්, පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ නියෝජිතයන්ගෙන්, පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත 'ජනතා සභා සීමා නිර්ණය කිරීමේ කොමිසමක්' පත්කොට එය මගින් ජනතා සභා ප්‍රදේශ තීරණය කළ යුතුය. මේ සඳහා තම අදහස" හා යොජ් නා ඉදිරිපත්කිරීමට ජනතාවටද අවසථාවක" ලබාදිය යුතුය. ජනතා සභා පිහිටුවීම සඳහා පාදක කරගන්නා නිර්ණායක
සකස් කර ගැනීමද ජනතා සභා සීමා නිර්ණය කිරීමේ කොමිසමේ කාර්යයක් වේ.

භාෂාව නිසා ඇතිවන පීඩාවන් අහෝසි කිරීම සඳහා ලංකාවේ පුරවැසියන් භාවිත කරන සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ජාතික භාෂා ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර එකී ඕනෑම භාෂාවකින් කටයුතු කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය පිළිගත යුතුය. ඒ අනුව කටයුතු කළ යුතුය. එහිදී උතුරු ප්‍රදේශයේ පොලිස් ස්ථාන, රජයේ කාර්යාල වැනි සිවිල් පාලනයට අදාල ආයතනවල හා පොදු සේවා වන සෞඛ්‍යය, ගමනාගමනය වැනි සේවාවල දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි පොලිස් නිලධාරීන් හා රජයේ සේවකයින් පත් කිරීමට පියවර
ගත යුතුය.

ඒ සඳහා
1. පොලිසියේ, ආරක්ෂක හමුදා හා රාජ්‍ය අංශයේ සේවය කරන සියලුම දෙනාට ජාතික භාෂා ඉගැන්වීම හා භාෂාවන් ඉගෙන ගැනීමට දිරිමත් කළ යුතුය.

2. නඩු විභාගවලදී කුමන අධිකරණයකදී වුවත් දෙමළ භාෂාව පමණක් දන්නා චූදිතයින් සඳහා



දෙමළ භාෂාවෙන් කටයුතු කිරීමේ අයිතිය පිළිගනිමින් ඔවුන්ට දෙමළ භාෂා පරිවර්තකයෙකු ලබාදිය යුතුය.

3. උතුරේ සෑම පොලිස් ස්ථානයකටම හා නැගෙනහිර හා සෙසු පළාත්වල අවශ්‍යතාවය අනුව පොලිස් ස්ථානවලට දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ උපාධිධාරීන් 10 බැගින් වූ බලතල සහිත මහජන සම්බන්ධීකරණ ඒකක පිහි-ටුවීමට පියවර ගත යුතුය.

4. රටේ සියලුම දරුවන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම ඉගැන්වීම සඳහා දැනට වඩා ප්‍රායෝගික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුය.

5. දෙවැනි භාෂාවක් ඉගෙන ගැනීමට කැමති වැඩිහිටියන් සඳහා සිංහල හා දෙමළ භාෂා පුහුණුව ලබාදෙන වැඩිහිටි අධ්‍යාපන වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුය. ඩසසග ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය ආදී ජනතාව භේද භින්න කරන සියලු මානව විරෝධී හා සමාජ විරෝධී මතවාද පැතිරවීම හා ඒවා ඉස්මතු කිරීම, ඒවාට අනුන් පෙළඹවීම, අනුබල දීම නැවැත්වීමට ක්‍රියාත්මක නෛතික පියවර ගත යුතුය. ඊට සමගාමීව ජාතික සමගිය හා සහජීවනය ගොඩ නැගීම වෙනුවෙන් කටයුතු කළ යුතුය.

ජාතිකත්ව, ආගමික, හෝ වෙනත් කිසිදු වෙනස්කමක් මත කිසිදු පුරවැසියකු නින්දාවට, අපහාසයට, අපහසුතාවයට, අසාධාරණයට පත්කිරීම සපුරා තහනම් කළ යුතු අතර එවැනි තත්වයන්ට පාත්‍රවන
සියලු දෙනාගේ පැමිණිලි භාරගැනීමට, ඒවා පරීක්ෂණය කිරීමට හා ඒ පිළිබඳ චූදිතයන් අධිකරණයට පැමිණිවීමට බලය ඇති වෙනස්කම් වැළැක්වීමේ කොමිසම් සභාවක් :ඣපපසිසදබ against Discrimination) ස්ථාපිත කළ යුතුය.

□ කිසියම් ප්‍රදේශයක ජන කණ්ඩායමක් තම ප්‍රදේශය සඳහා ජනතා සභාවක් අවශ්‍යය යැයි සිතන්නේ නම් ජනතා සභා නිර්ණය කිරීමේ කොමිසමෙන් එවැන්නක් ඉල්ලා සිටීමට පුළුවන. □ ජනතා සභා මහජන ඡන්දයෙන් පත්කරන අතර ඒවායේ වලංගු කාලසීමාව වසර පහක් විය යුතුය. එකී නියමිත කාලය පවත්වා ගෙනයාමට නොහැකිව ජනතා සභාව අක්‍රිය වන්නේ නම් හැර නියමිත කාලයට කලින් ජනතා සභා විසුරුවා හැරීම නොකළ
යුතුය.

□ මෙම ජනතා සභාවලින් එක් නියෝජිතයෙක් නිල බලයෙන් පාර්ලිමේන්තුවට පත්කිරීමේ අයිතිය ජනතා සභාවට ලබාදිය යුතුය. එකී පුද්ගලයා එම සභාවේ බහුතර කැමැත්ත මත පත්කළ යුතුය. ඔහු තම ජනතා සභාවේ වුවමනාවන් වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ යුතුය.

□ ජනතා සභාවේ ආර්ථික, සමාජ, සංස්කෘතික වර්ධනයට අදාල සියලු කටයුතු සඳහා අවශ්‍ය වන මූල්‍යමය ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ප්‍රමාණවත් ලෙස ඒවාට ලබාදිය යුතුය. එය ව්‍යවස්ථාවෙන්ම තහවුරු කළ යුතුය.

□ ජනතා සභාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ තම සභා බල ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය, පරිපාලන කටයුතු හා සමාජ සංස්කෘතිකමය කාර්යයන් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීමයි. □ ජනතා සභාවේ කාර්යයන් සඳහා පළාත් පාලන ආයතනවල සහායද ලබාදිය යුතුය.

□ ජනතාව තුළ බෙදී වෙන්වීමේ මනෝභාවය තුරන් කිරීම, ජාතික සමගිය ගොඩනැගීම, විවිධ ජන කණ්ඩායම්වල වෙනස් සංස්කෘතික ලක්ෂණ පිළිගැනීම, ඒවාට ගරු කිරීම හා විවිධ සංස්කෘතීන් අතර සහජීවනය ගොඩනැගීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ආර්ථික සංවර්ධනයට සියලු දෙනා දායක කර ගැනීම හා ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ සියලු දෙනාට සාධාරණව ලබාදීම මූලික කරගනිමින් මෙම ජනතා සභා ව්‍යූහය පවත්වාගැනීම කළ යුතුය.

මතු සම්බන්ධයි



# සිංහලයාගේ මූණ දෙමළා පොළොවෙ ඇතිල්ලීම

පැණි මුහුණු, බත් පැකට්, අරක්කු, සෙල්ෆෝන් හා බෝක්කු/පාරවල් වලට සිංහලයා කතිරය ගසද්දී උතුරේ දෙමළා මස් ලේ මතින් නැගිට තමන්ගේ ප්‍රතිපත්ති වලට පමණක් කතිරය ගසා කියා දුන් පාඩම දකුණේ කිසිවෙකු හෝ තේරුම් ගත්තේදැයි අපි නොදන්නෙමු. දෙමළ ජනයා එක හෙලා ඉල්ලා සිටින ස්වයං නිර්ණය අයිතිය වෙනුවෙන් ටීඑන්ඒ පෙනී සිටිද්දී ආණ්ඩුව සියළු කෛණහිලිකම් මැද විසින් ලබා දුන් උතුරු වසන්තයේ සියළුම භෞතික දෑ ප්‍රතික්ශේප කර තමන්ගේ නියෝජිතයින් වෙත දැවැන්ත ජයග්‍රහණයක් ලබා දීමට ඔවුහු උත්සුක වූහ.

බටහිර හා පෙරදිග අධිරාජ්‍යවාදීන්ගේ පූර්ණ සහයෝගය ඇතිව කොටි සංවිධානය සමූල ඝාතනය කළ ද මර්ධනය මතින් නැගිට ඔවුහු ටීඑන්ඒ සංවිධානය ජයග්‍රහණය කරවූයේ කණ්ඩායම් නායක විග්නේශවරන් විසින් කොටි සංවිධානයේ හිටපු නායක ප්‍රභාකරන් ත්‍රස්තවාදියෙකු නොව වීරයෙකු යැයි ප්‍රකාශ කර තිබිය දීය. සී.වී. විග්නේශවරන් යාපනය දිස්ත්‍රික්කයේ වැඩිම මනාප ඡන්ද 132,255 ලබාගත් අතර කොටි සංවිධානයේ දේශපාලන අංශ නායක එලිලන් ගේ බිරිද වන ආනන්දි සශිදරන් මනාප ඡන්ද 87,870 ලබා දෙවන ස්ථානයට පත්විය. කොටි සංවිධානය දැඩි ලෙස විවේචනය කරමින් කොටි සංවිධානය සමූල ඝාතනය කිරීමේ ආණ්ඩුව සම PUSHPA නිලනොවන එකගතාවක සිටි ආනන්ද සංගරී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තේරී පත්වුණු දෙවන අවසාන නියෝජිතයා ලෙස ලබා ගත හැකිවූයේ මනාප 2,896 ක් පමණි.

ඒ අතරම කොටි සංවිධානය මර්ධනය කිරීමට මහින්ද රාජපක්ෂ ධනපති ආණ්ඩුවට මානසික*කායික සහයෝගය ලබා දුන් ජවිපෙ ණිජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රවේශයක්ණි නම් වූ යෝජනා මාලාව පිළිගැනීමට උතුරේ සිටියේ 288 දෙනෙක් (0.06%) පමණි. අනෙත් පළාත් වල ඡන්ද ප්‍රතිශතයන් ද සළකා බලද්දී ජවිපෙ කුපිත වී ඇත්තේ සදාකාලිකව අබ්බගාතවය. තමන් විසින් බලයට රැගෙන ආ මහින්ද රාජපක්ෂ පමණක් නොව කර තියාගෙන ආ සරත් ෆොන්සේකා ද තුන්වන බලවේගය ලෙස තමන් අභිබවා ඉදිරියට යද්දී තමන් ප්‍රතිපත්තිමය වශයෙන් මෙන්ම ක්‍රියාකාරී බවින් ද දේශපාලනව නන්නත්තාර වී ඇති බව ජවිපෙ පිලිගත යුතුව ඇත.

මහින්ද රාජපක්ෂගේ මොර්තෙ දේශපාලනයට ගොදුරු වූ එජාපය අද උතුරේත් දකුණේත් වන්දනා කරුවන් මග හැලෙන නඩයක් පමණකි. නඩේ ගුරා වූ රනිල් වික්‍රමසිංහ යනු තවදුරටත් රාජපක්ෂ පාලනයට එරෙහිව සටන් වැදිය හැකි කැරිස්මාවක් සහිත සවිමත් නායකයෙකු නොවේ. විවධ මාර්ග වලින් නපුංසක කරනය කර තබවා ඇති රාජපක්ෂ ගේ තවත් එක් දේශපාලන ගොදුරකි.

තමන්ගේ විමුක්ති අරගලය වෙනුවෙන් සටන් වැද මියගිය දස දහස් ගණන් මහ විරුවන්ගේ මෙන්ම මරා දැමූ ලක්ෂ ගණනක් වූ අහිංසක නෑසියන්ගේ හෘද සාක්ෂයට වටිනාකමක් එකතු කිරීම ට මස් ලේ මතින් කොන්ද කෙළින් තබා ගත් උතුරේ දෙමළා මෙවර උතුරේ පළාත් සභා මැතිවරණය තුළ සමත් වූහ.

**අමු අමුවේ ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් පමණක් පක්ෂ මාරුකර අත දිග හැර මැතිවරණයට මුදල් දිගහැරි දයාසිරි වැන්නවුන්ට 336,327 වාර්තා සහගත මනාප සංඛ්‍යාවක් ලබා දුන් එමෙන්ම තවදුරටත් ඒකාධිපති රාජපක්ෂ පාලනය දෑත ඔසවා අනුමත කරන "වෙඩි කෑවත් කමක් නැහැ අපිට මෙහෙම හොඳයි" සිංහල ජනතාවක් දකුණේ අපට ඉතිරිව ඇත.**

අපට අපගේ දේශපාලනය හැසිරවිය යුතුව ඇත්තේ එවන් පසුගාමී සමාජයකය.

Loophole Blog





**OUT NOW**

***Domestic Violence And Child Abuse***

***By***

**Dr. Mathu H. Liyanage**
**PhD (Ireland), M. Litt (Australia), BA (Hons) London**

**Dr. Mathu Liyanage's fifth book, *Domestic Violence and Child Abuse*, written and published by him, is out and on sale now.**

The majority of the articles in the book relate to domestic violence and child abuse. These social problems, escalated in recent years, have become the most menacing threats to the society

They are: Soaring domestic violence a threat to society, Domestic violence the greatest social epidemic of our time, Tackling the scourge of child abuse, International day of the girl- child in the battle to fight child abuse, Drop controversial "stranger danger" signal to protect innocent children from sexual abuse, Child abuse requires multi-sectoral approach to combat probem, Rapid growth of internet and increased dangers of child abuse, and The dangers of pornography.

Other articles include: Reduce consumption of food and natural rescources for survival, Get smarter to avert disaster, Mona Lisa – the importance of mankind that captures the hearts of beauty and of fine art, The splendour of Ajanta caves, Religious festivals (Kandy and Kataragama) in Sri Lanka, Buddhist philosophy as seen by psychologists and philosophers, besides a few other articles.

**The book will provide you with interesting and enjoyable reading.**

Copies of the books can only be obtained from the author via email mathu27@yahoo.com They are not available with book sellers.
The book is priced at AUS $5.50 plus local postage ($1.20 per book).

